# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2007 සැප්තැම්බර් මස 21 වන දින

**II** වන කොටස

අතිරේකය

(2007. 09. 24 වන දින නිකුත් කරන ලදී.)

## ජාතික රුධිර පාරවිලයන සේවා

රුධිර පාරවිලයන සේවය විධිමත් කිරීම සහ නියාමනය කිරීම සඳහා ද ; ජාතික රුධිර ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා රට පුරා එළඳායි ආරක්ෂිත රුධිර සැපයුමක් තිබීම සහතික කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 12.75 යි. තැපැල් ගාස්තුව : රු.5.00 යි

කරනු ලබන (කවර හෝ ආකාරයකින් විස්තර කරනු ලැබූ) යම් පරිශ්‍රයක් අදහස් කරනු ලබන අතර, ඊට ආරෝග්‍ය ශාලාවක්, සාත්තු නිවාසයක්, මාතෘ නිවාසයක්, දන්ත ශල්‍යාගාරයක්, ඩිස්පැන්සරියක් සහ ශල්‍යාගාරයක් සහ ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලය සමග ලියාපදිංචි වෛද්‍ය නිලධරයකුගේ ආවරණය සහිත සමූපකාර ආරෝග්‍ය ශාලාවක් ද ඊට ඇතුළත් වේ ;

"රුධිරය" යන්නෙන්, පූර්ණ මනුෂ්‍ය රුධිරය අදහස් වේ ;

"ලේ බැංකුව" යන්නෙන්, රුධිරය එකතු කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ පහසුකම් ඇතිව හෝ නැතිව, රුධිරය හෝ රුධිර සංඝටක එකතු කිරීමේ, ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ පහසුකම් සලසන ස්ථානයක්, සංවිධානයක්, ඒකකයක් හෝ ආයතනයක් අදහස් වේ ;

"රුධිර සංඝටක" යන්නෙන්, රෝගීන්ට රුධිර පාරවිලයන කාර්යය සඳහා සම්පූර්ණ රුධිරය හෝ ප්ලාස්මා යන්ත්‍රානුසාරයෙන් වෙන් කිරීමේ ක්‍රියාවලිය මගින් පිළියෙල කරනු ලබන රුධිර සංඝටක අදහස් වේ ;

"රුධිර පරිත්‍යාගශීලියා" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි උපමාන සපුරාලන්නා වූ ද යම් ප්‍රභවයකින් මුදලින් හෝ අන්‍යාකාරයකින් යම් ප්‍රතිශ්‍යාවක් භාර නොගෙන රුධිරය පරිත්‍යාග කරන්නා වූ ද තැනැත්තෙක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**27**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

එල්.ඩී.—ඕ. 43/2001.

රුධිර පාරවිලයන සේවය විධිමත් කිරීම සහ නියාමනය කිරීම සඳහා ද; ජාතික රුධිර ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා රට පුරා ඵලදායි ආරක්ෂිත රුධිර සැපයුමක් තිබීම සහතික කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ආරක්ෂිත රුධිරය සඳහා ප්‍රවේශවීම සෑම මනුෂ්‍යයකුගේම පිළිගත් අයිතියක්වන හෙයින් ද, රුධිරය වටිනා මානව සම්පතක් වන බැවින්, රුධිර පාරවිලයනය රටේ සෞඛ්‍ය ක්‍රමයේ වැදගත් කොටසක් වන හෙයින් ද : පූර්විකාව.

ජාතික රුධිර පාරවිලයන සේවයට රටපුරා රුධිර පාරවිලයන සේවය ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරනු ලැබිය යුතු හෙයින් සහ රුධිර පාරවිලයනය මගින් ජීවිත ආරක්ෂාව සිදුවන නමුත් සුදුසු ආකාරයට පාලනය නොකිරීමෙන් මරණය වුව ද සිදු විය හැකි බැවින්, රුධිර පාරවිලයන සේවය ශක්තිමත් කිරීම සඳහා උපරිම ප්‍රමුඛත්වය ලබා දිය යුතු හෙයින් ද :

මහජනතාවට ලබා දෙන රුධිරය සහ රුධිර සංඝටකවල, සුරක්ෂිතභාවය, ප්‍රමාණවත් බව, ඵලදායී බව සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා ජාතික රුධිර ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබ ඇති හෙයින් ද :

ඵලදායී හා කාර්යක්ෂම ජාතික රුධිර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහතික කිරීමේ බලාපොරොත්තුව ඇතිව ජාතික රුධිර ප්‍රතිපත්තියට නීත්‍යානුකූල පිළිගැනීමක් දීම අවශ්‍යව ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක දරන ජාතික රුධිර පාරවිලයන සේවා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය.

2—PL 001510—375 (2006/10)

## I වන කොටස

### ජාතික රුධිර පාරවිලයන සේවයේ වගකීම් හා කාර්ය

ජාතික රුධිර පාරවිලයන සේවය.

**2.** සෞඛ්‍ය අමාත්‍යාංශයේ —

(අ) රුධිර පාරවිලයනය සඳහා හෝ රුධිර සංඝටක රෝගීන්ට ලබාදීම සඳහා භාවිතා කිරීමට අදහස් කරන—

(i) ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන රෝහල් ඇතුළුව රජයේ රෝහල් ; සහ

(ii) පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ආරක්ෂිත රුධිරය එකතු කිරීම, රුධිරය මගින් බෝවෙන රෝග සඳහා කෙරෙන මූලික පරීක්ෂණ සිදු කිරීම, පිරිසැකසුම් කිරීම, ගබඩා කිරීම සහ සැපයීම සඳහා ; සහ

(ආ) පරිපූර්ණ සහ ගුණාත්මක බව සහතිකක කිරීම කරා ලඟා වීම මගින් ඇතිව රට පුරා රුධිර පාරවිලයන සේවයෙහි ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා,

වගකිව යුතු රුධිර පාරවිලයන සේවයක් තිබිය යුතු ය.

ජාතික රුධිර පාරවිලයන සේවයේ කාර්ය.

**3.** ජාතික රුධිර පාරවිලයන සේවයේ කාර්යය වනුයේ—

(අ) අවදානම අඩු, ස්වේච්ඡාවෙන් රුධිරය දෙන, ගාස්තු නොලබන, රුධිර පරිත්‍යාගශීලීන්ගෙන් පමණක් රුධිරය ලබාගන්නා බවට සහතික වීම සඳහා රුධිර පරිත්‍යාගශීලීන් තෝරීමේ දී සැලකිලිමත් වීම ;

(ආ) (i) මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය(එච්. අයි. වී.);

(ii) හෙපටයිටිස් බී සහ සී ;

(iii) උපදංශ රෝගය (සිපිලිස්) ;

(iv) මැලේරියාව ; හෝ

(v) ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ පදනම් කරගෙන මෙහි ඇතුළත් කළයුතු බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් බෝවෙන රෝගයක්,

ඇතුළුව රුධිරය මගින් බෝවෙන රෝග සඳහා කෙරෙන මූලික පරීක්ෂණ මගින්, බෝවෙන රෝග තිබේ දැයි පරිත්‍යාග කරන ලද ලේ වලින් සොයා බැලීම ;

(ඇ) සියලු රුධිර පිරිසැකසුම් කිරීම සහ රුධිර සංඝටක පිළියෙල කිරීම ;

(ඈ) නියම කරනු ලැබිය හැකි ප්‍රමිතිවලට අනුකූලව ලේ සහ රුධිර සංඝටක ගබඩා කිරීම, පරීක්ෂා කරන ලද රුධිරය සහ රුධිර සංඝටක සැපයීම ;

(ඉ) හැකිතාක් දුරට සියලු කාණ්ඩවල රුධිර ප්‍රමාණයන් ලබාගැනීමට හැකියාව ඇති බවට සහ ඒවා ලබාගත හැකි බවට සහතික වීම ;

(ඊ) ජාතික ලේ බැංකුවේ, රජයේ රෝහල්වල සහ පෞද්ගලික වෛද්‍ය ආයතනවල කාර්ය මණ්ඩලවල සාමාජිකයන් සඳහා පුහුණුව ලබාදීම ;

(උ) රුධිර පාරවිලයනය සඳහා වූ ජාතික තොරතුරු පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීම ;

(ඌ) (i) ජාතික රුධිර පාරවිලයන සේවයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ;

(ii) පෞද්ගලික ආයතනවල රුධිර පාරවිලයන ඒකකය හසුරුවනු ලබන එම ආයතනයේ සාමාජිකයන්ට සහ එම ආයතනයට සම්බන්ධ සායනික කාර්ය මණ්ඩලයට;

(iii) රජයේ රෝහල්වල රුධිර පාරවිලයන ඒකකය හසුරුවනු ලබන එම ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට සහ එම් ආයතනයට සම්බන්ධ සායනික කාර්ය මණ්ඩලයට,

රුධිර පරිත්‍යාගශීලීන් තේරීම සහ රුධිරය සහ රුධිර සංඝටක එකතු කිරීම, රුධිරය මගින් බෝවෙන රෝග සඳහා කෙරෙන මූලික පරීක්ෂණ කිරීම, පිරිසැකසුම් කිරීම, ගබඩා කිරීම, නිකුත් කිරීම, ප්‍රවාහනය කිරීම සහ උචිත ලෙස භාවිතා කිරීම යන කරුණු සම්බන්ධයෙන් උපදෙස් මාලා නිකුත් කිරීම ;

(එ) (i) රෝගීන්ට සපයනු ලබන හෝ පාරවිලයනය කරනු ලබන රුධිරය සහ රුධිර සංඝටක නියමිත ප්‍රමිතිවලට අනුකූලව රුධිරය මගින් බෝවෙන රෝග සඳහා කෙරෙන මූලික පරීක්ෂණ කර ඇති බවට ;

(ii) රජයේ රෝහල්වල සහ පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලේ බැංකු කාර්ය පටිපාටියෙහි සේවයෙහි නියුතු වෛද්‍ය නිලධරයන් පුහුණු කරවීමට,

සහතිකවීම සඳහා පියවර ගැනීම ;

(ඒ) මේ පනතේ සියලු විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද සියලු නියෝගවලට සහ අමාත්‍යවරයා විසින් සහ 18 වන වගන්තිය යටතේ පත් කරනු ලබන කමිටුව විසින් දෙනු ලබන සියලු විධානවලට අනුකූලව ක්‍රියාකිරීමට සහතිකවීම ;

(ඔ) රුධිරය තැවරුණු සියලු ද්‍රව්‍ය ආරක්ෂිත ලෙස බැහැර කිරීම ;

(ඕ) රෝගීන්ට රුධිරය පාරවිලයනය කිරීමේ කාර්ය සඳහා බලපත්‍රලාභීන්ට සපයන ලද රුධිරය සහ රක්ත සෛල සාන්ද්‍ර ඒකකවල කාලය ඉකුත්වීමේ දිනයට දින දහයකට පෙර එම රුධිරය හෝ ඒකක ආපසු භාර දෙනු ලබන්නේ නම් එම රුධිරය හෝ ඒකක භාර ගැනීම ;

(ක) පරිත්‍යාග කරන ලද රුධිරයේ බෝවෙන රෝගයක් තිබිය හැකි බවට සොයාගැනීමේ දී නියමිත ජාතික ප්‍රමිතියකට අනුකූලව උචිත ක්‍රියා මාර්ග ගැනීම ;

(ග) ජාතික රුධිර පාරවිලයන සේවය සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාමට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම සහ වාර්තා කිරීම ; සහ

(ච) ජාතික රුධිර පාරවිලයන සේවයෙහි කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා පහසුකම් සැලසීම.

## II වන කොටස

## බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍රලාභියාගේ කාර්යය

4\. (1) මේ පනත බලාත්මක වූ දින සිට සහ ඉන් පසුව 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත යටතේ ලියාපදිංචි වූ ද, ස්වකීය ආයතනය ඇතුළත ලේ බැංකුවක් පිහිටුවීමට අදහස් කරන්නා වූ ද පෞද්ගලික වෛද්‍ය ආයතනයක් විසින්— බලපත්‍ර.

(අ) රෝගීන්ට රුධිර පාරවිලයනය කිරීමේ කාර්යය සඳහා රුධිරය හෝ රුධිර සංඝටක එකතු කිරීම හෝ පිරිසැකසුම් කිරීම ; සහ

(ආ) රෝගීන්ට රුධිරය පාරවිලයනය කිරීමේ කාර්යය සඳහා රුධිරය හෝ රුධිර සංඝටක ගබඩා කිරීම හෝ සැපයීම,

සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස නියමිත ගාස්තුව ද සමග නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" ලෙස හඳුන්වනු ලබන) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එම ඉල්ලුම් පත්‍රය සමග, නියම කරනු ලැබිය හැකි අතිරේක තොරතුරු ද ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට සුරක්ෂිත මහජන සෞඛ්‍ය ක්‍රමයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්—

(අ) බලපත්‍රයේ අන්තර්ගත නියම සහ කොන්දේසිවලට යටත්ව බලපත්‍රයක් නිකුත් කිරීම ; හෝ

(ආ) බලපත්‍රයක් නිකුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම,

කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රයක් අවුරුදු එකක කාලයක් සඳහා වලංගු වන අතර, එය අන්සතු කරනු ලැබිය නොහැකි ය. ඒ අනුව එවැනි යම් අන්සතු කිරීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු ය.

බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව.

**5**. (මෙහි මින් මතු "බලපත්‍රලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම පෞද්ගලික වෛද්‍ය ආයතනයක් විසින් ම, බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවන් හි දී එම බලපත්‍රය එම ආයතනයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

රුධිර පාරවිලයන සේවය පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව.

**6**. මේ පනත යටතේ ජාතික රුධිර පාරවිලයන සේවය විසින් සෑම බලපත්‍රලාභියකුට අදාල තොරතුරු සමග නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් පිළිබඳව ම රෙජිස්ටරයක් සකස් කොට පවත්වාගෙන යා යුතු ය.

වාර්තා පවත්වාගෙන යාම පිළිබඳ බලපත්‍රලාභියාගේ වගකීම.

**7**. බලපත්‍රලාභියා විසින් සියලු අවස්ථාවන් හි දී—

(අ) ජාතික රුධිර ප්‍රතිපත්තිය ආරක්ෂා කොට පිළිගත යුතු ය ;

(ආ) වාර්තා පවත්වාගෙන යා යුතු අතර ජාතික රුධිර පාරවිලයන සේවය මගින් ඉල්ලා සිටි විට එම වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

ලේ බැංකුවක් පවත්වාගෙන යෑම නවතා ඇති විට ඒ බව රුධිර පාරවිලයන සේවයට දැනුම්දීම බලපත්‍රලාභියාගේ වගකීම බව.

**8**. (1) බලපත්‍රලාභියා විසින්, බලපත්‍රය අදාළවන ලේ බැංකුවක ක්‍රියාකාරිත්වය නවතා ඇති අවස්ථාවක, එසේ ලේ බැංකුවේ ක්‍රියාකාරිත්වය තම ආයතනය විසින් නවතා ඇති බව එම පෞද්ගලික වෛද්‍ය ආයතනය විසින් වහාම ජාතික රුධිර පාරවිලයන සේවයට දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබීමේ දී, ජාතික රුධිර පාරවිලයන සේවය මගින් 6 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙන් එම බලපත්‍රලාභියාගේ නම ඉවත් කරනු ලැබිය යුතු අතර, එම පෞද්ගලික වෛද්‍ය ආයතනයට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින් ලේ බැංකුවක් පවත්වා ගෙන නොයන බවට විශ්වාස කිරීමට ජාතික රුධිර පාරවිලයන සේවයට හේතු ඇති අවස්ථාවක, ජාතික රුධිර පාරවිලයන සේවය මගින් එම බලපත්‍රලාභියා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යවමින් බලපත්‍රලාභියා විසින් ලේ බැංකුවක් පවත්වාගෙන යාම නවතා නොමැති බවට ඔප්පු කිරීමේ සාධක එම දැන්වීමේ දින සිට සති තුනක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස එම බලපත්‍රලාභියාට නියම කරනු ලැබිය හැකි ය. එම දැන්වීමේ නිශ්චිතව

දක්වා ඇති කාලය තුළ දැන්වීම මගින් නියම කර ඇති ඔප්පු කිරීමේ සාධක ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභියා අපොහොසත් වන අවස්ථාවක, ජාතික රුධිර පාරවිලයන සේවය විසින් 6 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙන් බලපත්‍රලාභියාගේ නම ඉවත් කරනු ලැබිය යුතු අතර, ඒ පෞද්ගලික වෛද්‍යායතනය වෙත නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රය අවලංගු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(4) පෞද්ගලික වෛද්‍යායතනයේ නම ඉවත් කිරීම සහ බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳව ජාතික රුධිර පාරවිලයන සේවය විසින් එම පෞද්ගලික වෛද්‍යායතනය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක ඇති විස්තරවල යම් වෙනසක් සිදු වූ විට එය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්විය යුතු බව.

**9**. සෑම බලපත්‍රලාභියකු විසින් ම ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තරවල යම් වෙනසක් සිදු වී දින තිහක් ඇතුළත ඒ වෙනස පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

බලපත්‍ර අලුත් කිරීම.

**10**. බලාත්මකව පවතින බලපත්‍රයක කාලය අවසන්වීමට ලිත් මාස තුනකට පෙර වූ කාලය ඇතුළත තත්කාර්ය සඳහා වූ නියමිත ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අවුරුදු එකක කාලයක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍ර අවලංගු කිරීම.

**11**. බලපත්‍රලාභියකු විසින්—

(i) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ඒ බලපත්‍රය යටත් වන යම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කර ඇති බවට ;

(ii) ලේ බැංකුව හරහා, ලේ බැංකුව විසින් සලසනු ලබන සේවාවලින් ප්‍රයෝජන ගන්නා තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ආරක්ෂාවට අහිතකර වන පරිදි ලේ බැංකුවේ කටයුතු සිදු කර ඇති බවට ;

(iii) ජාතික රුධිර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇති බවට,

ඒ බලපත්‍රලාභියාට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, ජාතික රුධිර පාරවිලයන සේවයේ නිර්දේශය මත, මේ පනත යටතේ

ජාතික රුධිර පාරවිලයන සේවයේ නිර්දේශය මත, මේ පනත යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට සහ බලපත්‍රයක් අවලංගු කිරීමට එරෙහිව අභියාචනා ආදිය.

**12.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක හෝ බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එකී පෞද්ගලික වෛද්‍ය ආයතනය විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ බලපත්‍රය අවලංගු කරන හෝ බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන තීරණය තමන් වෙත ලැබී දින තිහක් ඇතුළත, ඒ තීරණයට එරෙහිව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක් විසින්, ඒ තීරණයට එරෙහිව අමාත්‍යවරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඒ පිළිබඳ අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වේ. එම අභියාචන දෙකම මාස එකක කාලයක් ඇතුළත විභාග කර තීරණය කළ යුතු ය.

(3) එම අභියාචන විභාග කිරීමේ කාර්ය පටිපාටිය නියම කරන පරිදි විය යුතු ය.

විධාන.

**13.** මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් කලින්කළ, ජාතික රුධිර පාරවිලයන සේවය වෙත, රජයේ රෝහල් හෝ පෞද්ගලික වෛද්‍ය ආයතන වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ විධාන බලාත්මක කිරීම, ජාතික රුධිර පාරවිලයන සේවයේ, රජයේ රෝහල්වල හෝ පෞද්ගලික වෛද්‍ය ආයතනවල කාර්ය වන්නේ ය.

ඇතුළුවීමේ බලය.

**14.** මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක නියම හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කරන්නේ ද යන්න දැනගැනීමේ කාර්ය සඳහා, ජාතික රුධිර පාරවිලයන සේවය හෝ ජාතික රුධිර පාරවිලයන සේවය මගින් ලිඛිතව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ බලපත්‍රලාභියකු ලේ බැංකුවක් පවත්වාගෙන යන යම් පරිශ්‍රයකට හෝ මේ පනත යටතේ සේවා සැපයීමට බලපත්‍රලාභියකුට බලය පැවරී ඇත්තේ යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් ද ඒ පරිශ්‍රයට කවර හෝ අවස්ථාවක දී ඇතුළු විය හැකි ය.

බලපත්‍රයක් නොමැතිව ලේ බැංකුවක් පවත්වාගෙන යාම වරදක් බව.

**15.** මේ පනත යටතේ බලපත්‍රයක් නොලබා ලේ බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යන පෞද්ගලික වෛද්‍යායතනයක සෑම අධ්‍යක්ෂවරයකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

වැරදි.

**16.** (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන ;

(ආ) තමා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක හෝ ප්‍රකාශයක නැතහොත් තමා විසින් පවත්වාගෙන යනු ලබන යම් වාර්තාවක සඳහන් කරනු ලබන ප්‍රකාශයක්, වැදගත් සිද්ධිමය කරුණු පිළිබඳව වැරදි සහගත වන බව දැන දැනම ප්‍රකාශ කිරීම ;

(ඇ) ජාතික රුධිර පාරවිලයන සේවය හෝ එම සේවය මගින් ලිඛිතව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු මේ පනත මගින් පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී එම සේවයට හෝ එසේ බලය පවරනු ලැබූ තැනැත්තාට විරෝධය පාන හෝ බාධා කරන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

බලපත්‍රලාභීන්ගේ කාර්ය.

**17.** (1) බලපත්‍රලාභියකු විසින්—

(අ) අවදානම අඩු, ස්වේච්ඡාවෙන් රුධිරය දෙන, ගාස්තු නොලබන රුධිර පරිත්‍යාගශීලීන්ගෙන් පමණක් රුධිරය ලබාගන්නා බවට සහතික වීම සඳහා රුධිර පරිත්‍යාගශීලීන් තේරීමේ දී සැළකිලිමත් වීම ;

(ආ) නියම කරනු ලැබිය හැකි පිරිවිතරවලට අනුකූලව රුධිරය ගබඩා කිරීමේ පහසුකම් පිහිටුවිය යුතු ය ;

සේවයේ ලේ බැංකුවලින් ලබාගත යුතු සහ හැකිතාක් දුරට සියලු කාණ්ඩවල රුධිර ප්‍රමාණයක් ලබාගැනීමට හැකියාව ඇති බවට සහ එයට ප්‍රවේශවීමට හැකියාව ඇති බවට සහතික වීම ;

(ඈ) රෝගීන්ට සපයනු ලබන හෝ පාරවිලයනය කරනු ලබන රුධිරය සහ රුධිර සංඝටක බෝවන රෝග සඳහා කරන මූලික පරීක්ෂණ කර, පරීක්ෂා කරන බවට සහතික වීම ;

(ඉ) ජාතික රුධිර පාරවිලයන සේවය මගින් පුහුණු කරන ලද වෛද්‍ය නිලධරයන් පමණක් රුධිර පාරවිලයනයෙහි යෙදෙන බවට සහතිකවීම පිණිස සියලු පියවර ගැනීම සහ ජාතික රුධිර ප්‍රතිපත්තිය සහ ජාතික රුධිර පාරවිලයන සේවය මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් පෞද්ගලික වෛද්‍ය ආයතනවලට අනුයුක්ත වෛද්‍ය නිලධරයන්ට අවශ්‍ය පුහුණු කිරීම් සැපයීම ආදිය සඳහා සහතිකවීම පිණිස සියළු පියවර ගැනීම ;

(ඊ) මේ පනතේ සියලු විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම ;

(උ) අධීක්ෂණ කමිටුව සහ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් විධානවලට අනුකූලව ක්‍රියා කිරීම ;

(ඌ) රුධිරය තැවරුණු සියලු ද්‍රව්‍ය ආරක්ෂිත ලෙස බැහැර කිරීම ;

(එ) පරිත්‍යාග කරන ලද රුධිරයේ බෝවෙන රෝගයක් තිබිය හැකි බවට සොයා ගැනීමේ දී නියමිත ජාතික ප්‍රමිතියකට අනුකූලව උචිත ක්‍රියා මාර්ග ගැනීම ;

(ඒ) රුධිරය හෝ රුධිර සංඝටක එක් එක් ඒකකය සඳහා එම බලපත්‍රලාභියා විසින් ජාතික රුධිර පාරවිලයන සේවයට ගෙවන ලද මුදලට වැඩියෙන් යම් මුදලක් අය නොකළ යුතු බව :

එසේ වුවද, අතිරේක පරීක්ෂණ කරනු ලැබූ විට, ඒ සඳහා අධීක්ෂණ කමිටුව විසින් දෙනු ලබන මාර්ගෝපදේශවලට අනුව සේවා ගාස්තුවක් හෝ ගාස්තු, බලපත්‍රලාභියා විසින් වෙන් වෙන් වශයෙන් අයකර ගනු ලැබිය හැකි ය ; සහ

(ඔ) නියමිත ජාතික ප්‍රමිතීන්ට සහ ජාතික රුධිර පාරවිලයන

(ඔ) නියමිත ජාතික ප්‍රමිතීන්ට සහ ජාතික රුධිර පාරවිලයන සේවයේ අධීක්ෂණ කමිටුවේ විධානවලට අනුකූලව කාර්ය කරගෙන යාම.

## III වන කොටස

## පරිපාලනය

*රුධිර පාරවිලයන සේවා අධීක්ෂණ කමිටුව පිහිටුවීම.*

18. (මේ පනතේ "කමිටුව"යනුවෙන් සඳහන් කරනු ලබන) රුධිර පාරවිලයන සේවා අධීක්ෂණ කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එම කමිටුව—

(i) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්:—

(අ) කමිටුවේ සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) ජාතික රුධිර පාරවිලයන සේවයේ අධ්‍යක්ෂවරයා ;

(ඇ) ජාතික ලිංගාශ්‍රිත රෝග සඳහා සහ ඒඩ්ස් මර්ධන ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයා ;

(ඈ) පෞද්ගලික වෛද්‍යායතනයන්හි අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඉ) රසායනාගාර සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඊ) මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ; සහ

(ii) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්—

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්යවරයෙක් ;

(ආ) රක්තවේද වෛද්‍යවරුන්ගේ සංගමය මගින් නම් කරන ලද රක්තවේද වෛද්‍යවරයෙක් ;

(ඇ) කායික වෛද්‍යවරුන්ගේ සංගමය මගින් නම් කරන ලද කායික වෛද්‍යවරයෙක් ;

(ඈ) ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය මගින් නම් කරන ලද ශල්‍ය වෛද්‍යවරයෙක් ;

(ඉ) ප්‍රසව හා නාරි වෛද්‍යවරුන්ගේ සංගමය මගින් නම් කරන ලද ප්‍රසව වෛද්‍යවරයෙක් ;

(ඊ) ලියාපදිංචි පෞද්ගලික වෛද්‍යායතන විසින් ඔවුන් අතුරෙන් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක් ; සහ

(උ) ජාතික රුධිර පාරවිලයන සේවයේ විශේෂඥ වෛද්‍යවරු දෙදෙනකු සහ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් දස දෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්.

**19.** යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වුවහොත්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට නිශ්චය කරනු ලැබුවහොත් හෝ එසේ ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටි නම් හෝ එසේ දඬුවමක් විඳ ඇත්නම්; හෝ

(ඉ) කමිටුවේ සාමාජිකයකු ලෙස ඔහු විසින් ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඊට අහිතකර ලෙස බලපෑම් ඇතිවිය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

ඒ තැනැත්තා කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ දිගටම සේවය කිරීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

**පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.**

**20.** (1) සෑම පත් කළ සාමාජිකයෙක් ම, මියයෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හලහොත් මිස, සිය පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) පත් කළ සාමාජිකයකු, තමා නියෝජනය කරන ධුරය දැරීම අවසන් වීමේ දී, කමිටුවේ සාමාජිකයකු වීම ද අවසන් විය යුතු ය.

(3) කමිටුවේ යම් සාමාජිකයකු, හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ යම් සාමාජිකයකුගේ ධුර දැරීම අවසන් වන අවස්ථාවක දී, ඒ තැනැත්තාගේ ඉතිරි ධුර කාලය සඳහා, අමාත්‍යවරයා විසින්, 18 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

**කමිටුවේ අරමුණු.**

**21.** කමිටුව විසින් මේ පනත යටතේ වූ සිය කාර්ය සහ කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය :—

(අ) ජාතික රුධිර පාරවිලයන සේවය මගින් පවත්වාගෙන යා යුතු නියමිත ප්‍රමිති වැඩිදියුණු කිරීම, සුපරීක්ෂණය හා නියාමනය කිරීම ;

(ආ) බලපත්‍රලාභීන් විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිති ඇගයීමට භාජනය කිරීම ;

(ඇ) බඳවා ගැනීම් සඳහා වූ අවම සුදුසුකම්වලට හා තැනැත්තන් පුහුණු කිරීම සඳහා වූ අවම ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියා කරන බවට සහතික වීම.

**කමිටුවේ වැඩ කටයුතු සහ ගණපූරණය.**

**22.** (1) කමිටුව විසින් එහි වැඩ කටයුතු එහි රැස්වීමක දී විධිමත් කළ යුතු ය.

(2) කමිටුවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් අට දෙනකු විය යුතු ය.

**කමිටුවේ බලතල.**

**23.** 21 වන වගන්තියේ දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී කමිටුවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) රෝගීන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳව නිසි සැලකිල්ල ඇතිව පරිශ්‍රය නඩත්තු කරන්නේ ද රුධිර පාරවිලයන සේවය

පිළිබඳ විෂයයට අදාළ යම් නියෝගවල විධිවිධාන ඉටු කරනු ලබන්නේ ද යන වග ස්ථිර ලෙස දැනගැනීම පිණිස සහ සුදුසු කටයුතු සඳහා කමිටුවේ සභාපතිවරයා වෙත නිර්දේශ කිරීම පිණිස, ලේ බැංකුවක් පිහිටුවා ඇති සහ රුධිර පාරවිලයන කාර්ය පටිපාටි ඇති සහ රුධිර පාරවිලයන කාර්ය පටිපාටි කරගෙන යනු ලබන යම් පරිශ්‍රයකට යම් සාධාරණ වේලාවක දී ඇතුල් වී එවැනි බැංකුවක් විසින් පවත්වා ගෙන යා යුතු බවට නියම කර ඇති වාර්තා පරීක්ෂා කර බැලීමට කමිටුවේ යම් සාමාජිකයකුට හෝ තත් කාර්යය සඳහා කමිටුව විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට බලය දීම;

(ආ) බලපත්‍රලාභියාට නියම කර ඇති කොන්දේසි කලින් කල නිරීක්ෂණය කිරීම සහ නියමිත ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ඒවා ප්‍රතිශෝධනය කිරීම සහ සංශෝධනය කිරීම ;

(ඇ) ජාතික රුධිර පාරවිලයන සේවයේ රුධිර ඒකකයකට ගෙවන ලද මුදල සහ වෙනත් යම් සේවා ගාස්තු අයකර ගැනීම හැර, රෝගීන් සම්බන්ධයෙන් පාවිච්චි කිරීම සඳහා යම් තැනැත්තකුට රුධිරය හෝ රුධිර සංඝටක විකිණීම වැළැක්වීම ;

(ඈ) රෝගී සත්කාර සඳහා තත්ත්ව ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක වීම නියාමනය කිරීම ;

(ඉ) රුධිරයේ ආරක්ෂාව සහ ජාතික රුධිර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම ; සහ

(ඊ) වෛද්‍යවරයකු හෝ වෙනත් නිලධරයකු අනුකූලව ක්‍රියා නොකිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා ගත යුතු ක්‍රියා මාර්ග හඳුනා ගැනීම.

## IV වන කොටස

### පොදු විධිවිධාන

24. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ අවශ්‍ය වූ හෝ බලය දෙනු ලැබ ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කරුණු වලින් යම් කරුණක් හෝ ඒ කරුණු සියල්ලම සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය සහ නිකුත් කරනු ලැබීමට ඇති බලපත්‍රයේ අන්තර්ගත විය යුතු විස්තර සහ ඒ බලපත්‍රය යටත් විය යුතු නියම සහ කොන්දේසි කිසිවක් වෙතොත් ඒවා ;

(ආ) ජාතික රුධිර පාරවිලයන සේවයේ සහ පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලේ බැංකුවල තැබිය යුතු හෝ පවත්වා ගෙන යා යුතු වාර්තා, පොත්, රෙජිස්ටර, ලදුපත්, ප්‍රකාශ, ආකෘති පත්‍ර හෝ වෙනත් යම් ලේඛන ;

(ඇ) රුධිරය හෝ රුධිර සංඝටකවල සංයෝගය, තත්ත්වය සහ සුදුසු භාවිතය යන්නෙහි තිබිය යුතු බවට නියමිත ප්‍රමිතීන්;

(ඈ) (අවම සුදුසුකම් ඇතුළුව) කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ක්‍රම, ආරම්භක පුහුණුව සහ සේවාස්ථ පුහුණුව සහ ජාතික රුධිර පාරවිලයන සේවයට සහ ලේ බැංකුවලට අනුයුක්ත තැනැත්තන් විසින් හැදෑරිය යුතු පාඨමාලා ;

(ඉ) බෝවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ලොව පුරා පිළිගෙන ඇති පූර්වාරක්ෂා පිළිගැනීම;

(ඊ) යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ ඊට අනුයුක්ත යම් තැනැත්තකුට එරෙහිව, අතෘප්තියට පත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් භාර ගැනීමේ දී සහ එය විභාග කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය සහ පරිචය ;

(උ) රුධිරය හෝ රුධිය සංඝටක එකතු කිරීමේ, සංරක්ෂණය කිරීමේ, ගබඩා කිරීමේ හා පරීක්ෂා කිරීමේ ක්‍රමය ;

(ඌ) මේ පනතේ කාර්යය සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර ;

(එ) රුධිරය විශ්ලේෂණය කිරීමේ දී හෝ පරීක්ෂා කිරීමේ දී හා රුධිර සාම්පල ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ රුධිරය සහ රුධිර සංඝටක විශ්ලේෂණය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ; සහ

කරනු ලබන (කවර හෝ ආකාරයකින් විස්තර කරනු ලැබූ) යම් පරිශ්‍රයක් අදහස් කරනු ලබන අතර, ඊට ආරෝග්‍ය ශාලාවක්, සාත්තු නිවාසයක්, මාතෘ නිවාසයක්, දන්ත ශල්‍යාගාරයක්, ඩිස්පැන්සරියක් සහ ශල්‍යාගාරයක් සහ ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලය සමග ලියාපදිංචි වෛද්‍ය නිලධරයකුගේ ආවරණය සහිත සමූපකාර ආරෝග්‍ය ශාලාවක් ද ඊට ඇතුළත් වේ ;

"රුධිරය" යන්නෙන්, පූර්ණ මනුෂ්‍ය රුධිරය අදහස් වේ ;

"ලේ බැංකුව" යන්නෙන්, රුධිරය එකතු කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ පහසුකම් ඇතිව හෝ නැතිව, රුධිරය හෝ රුධිර සංඝටක එකතු කිරීමේ, ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ පහසුකම් සලසන ස්ථානයක්, සංවිධානයක්, ඒකකයක් හෝ ආයතනයක් අදහස් වේ ;

"රුධිර සංඝටක" යන්නෙන්, රෝගීන්ට රුධිර පාරවිලයන කාර්යය සඳහා සම්පූර්ණ රුධිරය හෝ ප්ලාස්මා යන්ත්‍රානුසාරයෙන් වෙන් කිරීමේ ක්‍රියාවලිය මගින් පිළියෙල කරනු ලබන රුධිර සංඝටක අදහස් වේ ;

"රුධිර පරිත්‍යාගශීලියා" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි උපමාන සපුරාලන්නා වූ ද යම් ප්‍රභවයකින් මුදලින් හෝ අන්‍යාකාරයකින් යම් ප්‍රතිෂ්ඨාවක් භාර නොගෙන රුධිරය පරිත්‍යාග කරන්නා වූ ද තැනැත්තෙක් අදහස් වේ.

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.